# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 242/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 10/02/2024 පැය 1600

## මාධ්‍ය නිවේදනය

**මල්වතුහිරිපිටිය පොලිස් වසමේදී හිමිනමක් වෙඩිතබා ඝාතනය කිරීමේ සිද්ධියේ තවත් සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය.**

2024.01.23 වන දින රාත්‍රී කාලයේ මල්වතුහිරිපිටිය පොලිස් වසමේ විහාරස්ථානයක වැඩ විසූ හිමිනමකට වෙඩි තබා ඝාතනය කිරීමේ අපරාධය සම්බන්ධයෙන් බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය මඟින් විමර්ශන ආරම්භ කර තිබුණි.

ඒ අනුව 2024.02.09 වන දින රාත්‍රී කාලයේ කඩුවෙල පොලිස් වසමේ වෙලේ හංදිය ප්‍රදේශයේදී මෙම අපරාධයට ගිනි අවි පුපුරණ ද්‍රව්‍ය හා කාර් රථය සැපයූ සැකකරුවෙකු විදේශ රටක නිෂ්පාදිත ජීව අත්බෝම්බයක්, රිවොල්වර ගිනි අවියක්, හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 210 ක්, අත්විලංගු ජෝඩුවක්, ටී56 හිස් පතරොම් ගැබ් 03 ක්, ටී56 ජීව පතරොම් 06 ක්, වෑන් රථයක් හා ජංගම දුරකථන දෙකක් ඇතුළු දේපල සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වූ ඔරුවල, අතුරුගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු දැනට විදේශගතව සිටින සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයන් දෙදෙනෙකුගේ මෙහෙයවීමෙන් මෙරට සිදු කරනු ලබන මත්ද්‍රව්‍ය ජාවාරම් හා අපරාධ වලට ඍජුවම සම්බන්ධ බවට දැනට සිදු කරන ලද විමර්ශන වලදී අනාවරණය වී ඇත. බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය<br>
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.